සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2018
# වාණිජ්‍යකත්ව අධ්‍යයනය - I

**11 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. ගැටලු සහ අවස්ථා දෙස බලා ඒවාට විසඳුම් ලෙස නව අදහස් සංවර්ධනය කිරීමට හෝ නව මාර්ග සොයා ගැනීමට ඇති හැකියාව හඳුන්වනු ලබන්නේ,
    (1) නවෝත්පාදනය ලෙසය. (2) නම්‍යශීලීත්වය ලෙසය.
    (3) නිර්මාණශීලීත්වය ලෙසය. (4) අවදානම් භාර ගැනීම ලෙසය.

02. නිර්මාණශීලීව විසඳුම් ඉදිරිපත් කිරීමේ දී විවිධ බාධා මතුවිය හැකිය. එසේ මතුවිය හැකි බාධාවකි,
    (1) ක්ෂණික ප්‍රතිඵල අපේක්ෂා කිරීම. (2) ගැටලු අභියෝග ලෙස දැකීම.
    (3) විවිධත්වය ග්‍රහණය කර ගැනීම. (4) කුතුහලය දිරිමත් කිරීම.

03. අවදානමට ප්‍රධානම හේතුව වන්නේ,
    (1) දැඩි ආශාවයි. (2) අවිනිශ්චිතතාවයයි. (3) සාමාන්‍ය වැටහීමයි. (4) ස්වයං පෙළඹවීමයි.

04. තෝමස් අල්වා එඩිසන් තුළ පැවති ව්‍යවසායකත්ව ගතිලක්ෂණය හඳුන්වන්නේ,
    (1) තොරතුරු සොයා බැලීම ලෙසය.
    (2) පරිසර සංවේදී බව හා අවස්ථා හඳුනා ගැනීම ලෙසය.
    (3) අසීරු අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි ඇති නැඹුරුව ලෙසය.
    (4) ස්වකීය සාර්ථකත්වය තමා අනුව තීරණය මත බවට ඇති විශ්වාසය ලෙසය.

05. කලින් සැලසුම් කල දෙයක් නිසා නොව බලාපොරොත්තු නොවූ විටක භාණ්ඩයක් හෝ සේවාවක් බිහිවීම හඳුන්වනු ලබන්නේ,
    (1) දැනුම පදනම් කරගත් සංකල්පයක් ලෙසය.
    (2) සංජානනය හෙවත් තේරුම් ගන්නා ආකාරය වෙනස් වීමක් ලෙසය.
    (3) වෙළෙඳපොළ තුළ සිදුව ඇති වෙනස්වීමක් ලෙසය.
    (4) නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍රයක් ලෙසය.

06. පවතින සංකල්ප හෝ සාධකවල නව සංයෝගයක් හෝ මිශ්‍රණයක් භාවිත කර නව නිපැයුමක් බිහි කිරීමට අදාළ ව උදාහරණයක් වන්නේ,
    (1) ස්මාට් ජංගම දුරකථනය බිහි කිරීමය. (2) ස්වයං සේවා අලෙවි ක්‍රම බිහි කිරීමය.
    (3) විද්‍යුත් ගෙවීම් ක්‍රම බිහි කිරීමය. (4) සහල් පිටි ඇසුරින් බේකරි නිෂ්පාදන බිහි කිරීමය.

07. යහපත් මානව සම්බන්ධතා පවත්වාගැනීම යනු,
    (1) කුඩා පරිමාණ ව්‍යාපාර සාර්ථක කර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ගයකි.
    (2) කුඩා පරිමාණ ව්‍යාපාරවල පවතින ශක්තියකි.
    (3) කුඩා පරිමාණ ව්‍යාපාරවලට බලපාන අවස්ථාවකි.
    (4) කුඩා පරිමාණවල පවතින වාසි සහගත තත්වයකි.

08. ව්‍යාපාරයකට යොදවා ඇති සම්පත් ව්‍යාපාරයේ අරමුණු ළඟාකර ගැනීම සඳහා නිසි ලෙස හසුරුවා ලීම සිදු කරනු ලබන්නේ,
   (1) කළමනාකරුගේ භූමිකාව යටතේ ය.  (2) නායකයාගේ භූමිකාව යටතේ ය.
   (3) අයිතිකරුගේ භූමිකාව යටතේ ය.  (4) ප්‍රධානියාගේ භූමිකාව යටතේ ය.

09. ව්‍යාපාර අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් හඳුනාගනු ලබන්නේ ව්‍යාපාරයේ ඇති,
   (1) තර්ජන හා ශක්තීන් ය.  (2) ශක්තීන් හා දුර්වලතා ය.
   (3) තර්ජන හා අවස්ථා ය.  (4) අවස්ථා හා දුර්වලතා ය.

10. ව්‍යාපාරට ඍජුව ම බලපෑම් කරන, නමුත් එම බලපෑම් ව්‍යාපාරයට පාලනය කළ හැකි බලවේග ක්‍රියාත්මක වන පරිසරය වන්නේ,
   (1) ආසන්න පරිසරයයි.  (2) බාහිර පරිසරයයි.
   (3) තාක්ෂණික පරිසරයයි.  (4) අභ්‍යන්තර පරිසරයයි.

11. දළදා පෙරහැර නැරඹීමට විදේශිකයින් පැමිණීම, බාහිර පරිසරයේ කුමන පරිසර සාධනය යටතේ ඇති වන කවර තත්වයක් ද?
   (1) ගෝලීය පරිසරයේ ඇති වන තර්ජනයකි.  (2) ආර්ථික පරිසරයේ ඇති වන තර්ජනයකි.
   (3) ගෝලීය පරිසරයේ ඇති වන අවස්ථාවකි.  (4) ස්වාභාවික පරිසරයේ ඇති වන අවස්ථාවකි.

12. ව්‍යවසායකයකු වෙළෙඳපළට පිවිසීමේ දී වියපත් පෙනුම අඩු කිරීම සඳහා විවිධ නිෂ්පාදිත ඉදිරිපත් කිරීම හඳුන්වා දිය හැකි වන්නේ,
   (1) නව භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපොළකට ඉදිරිපත් කිරීමක් ලෙසය.
   (2) නව භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළඳපොළකට හඳුන්වා දීමක් ලෙසය.
   (3) පවත්නා භාණ්ඩයක් හෝ සේවාවක් පවත්නා වෙළඳපොළකට ඉදිරිපත් කිරීමක් ලෙසය.
   (4) පවත්නා භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපොළකට ඉදිරිපත් කිරීමක් ලෙසය.

13. අවදානම් භාරගන්නා පුද්ගලයාට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් අත් කර දීමට හැකි ආකර්ශනීය ව්‍යාපාර අදහසක් හඳුන්වනු ලබන්නේ,
   (1) ව්‍යාපාර අවස්ථාවක් ලෙසය.
   (2) හොඳ ව්‍යාපාර සැලැස්මක් ලෙසය.
   (3) යෝග්‍ය ව්‍යාපාර සංකල්පයක් ලෙසය.
   (4) ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපාර සැලැස්මක් ලෙසය.

14. නව සොයා ගැනීමක අයිතිය ආරක්ෂා කර ගැනීමට නිකුත් කරනු ලබන පේටන්ට් බලපත්‍රයක වලංගු කාලය වන්නේ,
   (1) අවුරුදු 03 කි.  (2) අවුරුදු 05 කි.  (3) අවුරුදු 07 කි.  (4) අවුරුදු 20 කි.

15. SCAMPER ආකෘතියට අනුව පැරණි ඇඳුම් විලාසිතා නව ක්‍රමයට ඉදිරිපත් කිරීම හඳුවන්නේ,
   (1) ඉවත් කිරීමක් ලෙසය.  (2) ආදේශ කිරීමක් ලෙසය.
   (3) යලි සකස් කිරීමක් ලෙසය.  (4) සම්බන්ධ කිරීමක් ලෙසය.

16. විවිධ පාරිභෝගික කණ්ඩායම් (කොටස්) ඉලක්ක කොටගෙන භාණ්ඩ හා සේවා ඉදිරිපත් කළ හැකිය. එහිදී සලකා බලන ප්‍රධානම සාධක දෙක වන්නේ,
   (1) අවශ්‍යතාවය හා වුවමනාව පිළිබඳවය.
   (2) රුචිකත්වය හා ලැදියාව පිළිබඳවය.
   (3) අවශ්‍යතාවය හා රුචිකත්වය පිළිබඳවය.
   (4) රුචිකත්වය හා මිලදී ගැනීමේ හැකියාව පිළිබඳවය.

17. ශ්‍රී ලංකාවේ සුළභ සම්පත් පිළිබඳව සලකා බැලීමේදී ව්‍යාපාර කටයුතුවල නිරත කළමනාකරුවන් හා කළමනාකරණ නොවන සේවකයින් සලකනු ලබන්නේ,
   (1) මානව සම්පත් ලෙසය.  (2) ඇල්මැති පාර්ශවයන් ලෙසය.
   (3) ශ්‍රම සම්පත් ලෙසය.  (4) සුවිශේෂී සම්පතක් ලෙසය.

18. වෙළඳාම හා වෙළඳාමට අවශ්‍ය උපකාරක සේවා අයත් වන්නේ ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශයක් වන,
   (1) ප්‍රාථමික අංශයටය.  (2) ද්විතීක අංශයටය.  (3) ව්‍යාපාර අංශයටය.  (4) තෘතික අංශයටය.

19. ලාභ අපේක්ෂාවෙන් ව්‍යාපාර කටයුතුවල නිරතවන ව්‍යවසායකයෝ හඳුන්වන්නේ,
(1) ව්‍යාපාර ව්‍යවසායකයෝ ලෙසය. (2) ආයතනික ව්‍යවසායකයෝ ලෙසය.
(3) සමාජයීය ව්‍යවසායකයෝ ලෙසය. (4) වෙළඳ ව්‍යවසායකයෝ ලෙසය.

20. ව්‍යවසායකත්ව කාර්යයේ නිරතවීමෙන් ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභයකි,
(1) ස්වයංපෝෂිත බව (2) රැකියා අවස්ථා ජනනය වීම
(3) ආදායම් බෙදීයාමේ විෂමතාවය අඩුවීම (4) කාර්යයන් ඉතා පහසුවීම

21. පහත දැක්වෙන්නේ ව්‍යාපාර සැලැස්මක ඇතුළත් කරන තොරතුරු සහ එම තොරතුරු ඇතුලත් වන සැලසුම් අංග වේ. ඒවා නිවැරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

| තොරතුරු | සැලැස්ම |
|---|---|
| 1. භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම | A - මූල්‍ය සැලැස්ම |
| 2. ව්‍යාපාරයට අවශ්‍ය මානව සම්පත | B - විධායක සාරාංශය |
| 3. ව්‍යාපාරයේ සුවිශේෂීභාවය | C - අලෙවි සැලැස්ම |
| 4. ව්‍යාපාරයේ මුදල් ගලා යෑම් | D - පරිපාලන සැලැස්ම |

(1) 1 - B, 2 - D, 3 - A, 4 - C (2) 1 - C, 2 - D, 3 - B, 4 - A
(3) 1 - C, 2 - A, 3 - B, 4 - D (4) 1 - C, 2 - D, 3 - A, 4 - B

22. අලෙවි සැලැස්මක අන්තර්ගත කොටසක් වන්නේ,
(1) ඒකකයක පිරිවැය (2) සේවක වැටුප් හා වේතන
(3) වෙළඳපොළ විශ්ලේෂනය (4) අපේක්ෂිත ප්‍රතිඵලය

23. යම් භාණ්ඩයක් සඳහා අදාල ප්‍රදේශය තුල සතියක ඉල්ලුම ඒකක 15000 ක් බව අනාවරණය විය. දැනට සිටින තරගකරුවන් ඉන් ඒකක 10000 ක් පමණක් සපයන්නේ නම් වෙළඳපොළ හිඩැස වන්නේ,
(1) ඒකක 15000 කි. (2) ඒකක 25000 කි. (3) ඒකක 5000 කි. (4) ඒකක 10000 කි.

24. කිසියම් අපේක්ෂිත නිෂ්පාදන ඒකක ප්‍රමාණයක් සඳහා දැරීමට සිදුවන පිරිවැය ඇස්තමේන්තු කර පිළියෙල කරන ලේඛනය,
(1) පරිපාලන සැලැස්මයි (2) නිෂ්පාදන සැලැස්මයි (3) අලෙවි සැලැස්මයි (4) මූල්‍ය සැලැස්මයි

25. පහත දැක්වෙන දෑ අතුරින් නිෂ්පාදන ස්ථාවර වත්කමක් වන්නේ,
(1) අලෙවි සැල (2) අමුද්‍රව්‍ය (3) කාර්යාල උපකරණ (4) යන්ත්‍ර සූත්‍ර

26. යම් ආයතනයක කාර්යයන් අනුව අංශ බෙදී ඇති ආකාරයත්, ඒ අනුව ඇතිකල තනතුරු හා ඒවායේ පෙළගැස්මත් දැක්වෙන්නේ,
(1) පරිපාලන සැලැස්මේය. (2) විධායක සාරාංශයේය.
(3) සංවිධාන සටහනේය. (4) ආයෝජන ඇස්තමේන්තුවේය.

27. පහත වියදම් අතරින් පරිපාලන වියදමක් ලෙස සැලකිය හැක්කේ,
(1) අලෙවි රථයේ ක්ෂය (2) තැපැල් වියදම් (3) යන්ත්‍ර ක්ෂය (4) කම්හල් කුලී

28. මූල්‍ය සැලසුමක අන්තර්ගත කොටසක් නොවන්නේ,
(1) වෙළඳපොළ විශ්ලේෂණය (2) ව්‍යාපාර ප්‍රතිඵල ගනනය
(3) මුළු ආයෝජන ඇස්තමේන්තුව (4) ව්‍යාපාර ආරම්භයට පෙර වියදම්

- **පහත තොරතුරු ඇසුරින් 29, 30, 31 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

සහන් 2018 ජනවාරි මාසයේ දී රු. 200 000 යොදවා ව්‍යාපාරයක් ඇරඹූ අතර මාසය තුල විකුණුම් තුළින් රු. 300 000 ක ආදායමක් ලැබුණි. විකිණීමට භාණ්ඩ මිලට ගැනීමට රු. 150 000 හා වෙනත් වියදම් සඳහා රු. 50 000 වැය විය.

29. සහන්ගේ ව්‍යාපාරයේ ජනවාරි මාසයේ මුළු මුදල් ගලා ඒම් ප්‍රමාණය,
(1) රු. 200 000 කි. (2) රු. 300 000 කි. (3) රු. 450 000 කි. (4) රු. 500 000 කි.

30. සහන්ගේ ව්‍යාපාරයේ මුළු මුදල් ගලායාම් ප්‍රමාණය,
(1) රු. 150 000 කි. (2) රු. 200 000 කි. (3) රු. 300 000 කි. (4) රු. 500 000 කි.

31. සහන්ගේ ව්‍යාපාරයේ ජනවාරි මස මුදල් ශේෂය,
(1) රු. 200 000 කි. (2) රු. 300 000 කි. (3) රු. 500 000 කි. (4) රු. 700 000 කි.

32. පොදු අරමුණක් වෙනුවෙන් සංවිධානය වූ පුද්ගලයන් කණ්ඩායමකින් සැදුම්ලත් ඒකකය,
(1) සංවිධානයකි. (2) ව්‍යාපාරයකි. (3) ව්‍යාපාර සංවිධානයකි. (4) සමාගමකි.

33. ඕනෑම ව්‍යාපාර සංවිධානයක පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණයක් නොවන්නේ,
(1) සීමිත සම්පත් භාවිතය (2) ලාභ ඉපයීම
(3) ආර්ථික කටයුත්තක් නොයෙදීම (4) සාමූහික සම්බන්ධතාවක් පැවතීම

34. කේවල ස්වාමී ව්‍යාපාරයක සීමාවක් ලෙස සැලකිය හැක්කේ,
(1) සුළු ප්‍රාග්ධනයකින් ආරම්භ කල හැකිවීම. (2) බලපාන නීතිරීති අල්ප වීම.
(3) ස්වාධීන තීරණ ගත හැකිවීම. (4) අයිතිකරුගේ වගකීම අසීමිත වීම.

35. හවුල් ව්‍යාපාරයක් ආරම්භයේදී ඇති කර ගන්නා ලිඛිත එකඟතාව,
(1) හවුල් ගිවිසුමයි. (2) හවුල් ආඥාපනතයි.
(3) හවුල් ඔප්පුවයි. (4) හවුල් ව්‍යාපාර සැලැස්මයි.

36. අනෙකුත් ව්‍යාපාර සංවිධාන හා සසඳන විට සමාගමක පමණක් දැකිය හැකි විශේෂ ලක්ෂණයකි,
(1) ආරම්භය පහසු වීම. (2) නීතිමය බලපෑම අඩු වීම.
(3) කොටස් නිකුත් කිරීමෙන් ප්‍රාග්ධනය රැස්කිරීම. (4) නෛතික පුද්ගල භාවයක් නොමැතිවීම.

37. පහත දැක්වෙන ප්‍රකාශ අතරින් ව්‍යවසායකත්ව සංස්කෘතිය වඩාත් හොඳින් විස්තර වන ප්‍රකාශය තෝරන්න.
(1) සමාජය තුළ ව්‍යවසායකයන් පිළිබඳව ගොඩනැගී ඇති විවිධ මතවාද ව්‍යවසායකත්ව සංස්කෘතිය වේ.
(2) ව්‍යවසායකයන්ට ආවේණික වූ විවිධ ගති පැවතුම් ආකල්ප, විශ්වාස, අදහස්, හැසිරීම් රටා ව්‍යවසායකත්ව සංස්කෘතිය වේ.
(3) පරිසරයේ වෙනස්වීම් වලට ප්‍රතිචාර දක්වමින් ව්‍යාපාර අවස්ථා උදාකරගැනීම ව්‍යවසායකත්ව සංස්කෘතිය වේ.
(4) ගැටළුවකට විසඳුම් වශයෙන් සමාජයට වැඩදායී ලෙස නවෝත්පාදන බිහිකිරීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්ව සංස්කෘතිය වේ.

38. ව්‍යවසායකයෙකු වීමට කාන්තාව තුළ ඇති ශක්තියක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) කාන්තාව තුළ ස්වයං විනය පැවතීමයි.
(2) කාන්තාව උසස් අධ්‍යාපනයට යොමු වීමයි.
(3) කාන්තාව පවුල තුළ වැදගත් ස්ථානයක් ගැනීමයි.
(4) කාන්තාව සතු මූල්‍යමය හැකියාවයි.

39. පහත දැක්වෙන්නේ ව්‍යාපාර වෙනුවෙන් රජය ලබාදෙන දිරිගැන්වීම් කිහිපයකි. ඒවා අතරින් මූල්‍ය නොවන දිරිගැන්වීමක් පමණක් ඇති පිළිතුර තෝරන්න.

A - ණය පහසුකම් B - උපදේශන සේවා
C - තාක්ෂණික සේවා D - ත්‍යාග හා මූල්‍යාධාර
E - වෙළඳපොළ පහසුකම්

(1) A හා B (2) C හා D (3) B හා C (4) A හා D

40. ව්‍යාපාරයක නිෂ්පාදන පිරිවැය තුළ අන්තර්ගත කොටසක් වන්නේ,
(1) වත්කම් මිලට ගැනීමේ පිරිවැය (2) අමුද්‍රව්‍ය පිරිවැය
(3) තොග මිලට ගැනීමේ පිරිවැය (4) වෙළඳ භාණ්ඩ තොග මිලට ගැනීමේ පිරිවැය

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **ව්‍යවසායකත්ව අධ්‍යයනය - II** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තමාගේම කියා ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දැඩි ආශාවෙන් පසු වූ දසුන් තම සිත තුළ පහළ වූ චින්තනය මෙහෙයවා වගාවන් සඳහා තෙතමනය රැඳෙන පරිදි ''සිසිල නිෂ්පාදිත'' නමින් ශාක වටේට තැබිය හැකි ආවරණයක් නිෂ්පාදනය කිරීමට තීරණය කරන ලදී.

මේ සඳහා දසුන් විසින් වෙළඳපොළ අධ්‍යයනයකින් පසු ප්‍රදේශයේ සිටින මුළු ජනගහනය 2000 ක් පමණ වන බවත් ඔවුන්ගෙන් 75% ක් පමණ මෙම ''සිසිල නිෂ්පාදිත'' මිලදී ගැනීමටත් කැමැත්තක් දක්වන බවත් හඳුනා ගන්නා ලදී.

මොහු විසින් මාසයකට සිසිල නිෂ්පාදිත 1000 ක් නිෂ්පාදනය කිරීමට අදහස් කරන අතර ඒ සඳහා පහත සඳහන් වියදම් දැරීමට නියමිතය.

| | | |
|---|---|---|
| කොහු බත් සඳහා | රු. | 2000 |
| මැටි ලබා ගැනීම සඳහා | රු. | 1000 |
| වැලි සඳහා | රු. | 3000 |
| රබර් කිරි සඳහා | රු. | 1500 |

පුහුණු ශ්‍රමිකයින් දෙදෙනෙකු හා එක් අයෙකුට රු. 15 000 ක මාසික වැටුපක් ගෙවීමටද අදහස් කරයි.

නුපුහුණු සේවකයකු යොදාගැනීමට නියමිත අතර ඔහුට රු. 10000 ක වැටුපක් ගෙවීමට ද අදහස් කරයි.

i. සිද්ධියෙහි සඳහන් ව්‍යවසායකත්ව ගති ලක්ෂණ 02 ක් සඳහන් කරන්න.
ii. මෙහි සඳහන් නිෂ්පාදිතයේ නම සඳහන් කරන්න.
iii. සිද්ධියේ සඳහන් ව්‍යාපාර අදහස පහළ වූ මූලාශ්‍රය සඳහන් කරන්න.
iv. දසුන් විසින් අධ්‍යයනය කරන්නට ඇති බාහිර ව්‍යාපාර පරිසර සාධකය සඳහන් කරන්න.
v. දසුන්ගේ සිසිල නිෂ්පාදිත අයත්වන්නේ ශ්‍රී ලංකා ආර්ථිකයේ කුමන ව්‍යාපාර අංශයට ද?
vi. මෙම ව්‍යාපාරය තුළින් ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ 02 ක් සඳහන් කරන්න.
vii. සිද්ධිය තුළ සඳහන් වන කළමනාකරණ කාර්ය අතුරින් සැලසුම්කරණයට අදාළ කාර්යය සඳහන් කරන්න.
viii. සිසිල නිෂ්පාදිත 1000 ක් සඳහා දැරීමට නියමිත මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.
ix. සිසිල නිෂ්පාදිත ඒකකයක් නිපදවීම සඳහා යන පිරිවැය ගණනය කරන්න.
x. සිසිල නිෂ්පාදිත පරිභෝජනය කිරීමට කැමති පාරිභෝගික සංඛ්‍යාව කොපමණ ද?

(ලකුණු 02 × 10 = 20)

(02) i. පුද්ගලයකුගේ නිර්මාණශීලීත්වය වර්ධනය කරගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග 04 ක් සඳහන් කරන්න.
ii. නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍ර 04 ක් සඳහන් කරන්න.
iii. ව්‍යවසායකත්වය තුළින් බිහිවන ප්‍රධාන ප්‍රතිලාභ 02 ක් සඳහන් කරන්න.
iv. කුඩා පරිමාණ ව්‍යාපාර ආශ්‍රිතව දැකිය හැකි ශක්තීන් 04 ක් සඳහන් කරන්න.
v. කුඩා පරිමාණ ව්‍යාපාරයක් යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 02 × 05 = 10)

(03) i. ව්‍යවසායකයකු විසින් වර්ධනය කරගත යුතු මූලික කුසලතා 04 ක් සඳහන් කරන්න.
ii. ව්‍යාපාර පරිසරය පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් ව්‍යවසායකයකුට අත්කරගත හැකි ප්‍රයෝජන 02 ක් සඳහන් කරන්න.

iii. පේටන්ට් බලපත්‍රයක් පිරිනැමීම සඳහා නව සොයාගැනීමක් ලෙස සලකන අයිතම 02 ක් සඳහන් කරන්න.
iv. ශ්‍රී ලංකාවේ සුළභ සම්පත් අතරින් මානව නොවන සම්පතක් වන සංස්කෘතික සම්පත් සඳහා උදාහරණ 04 ක් සපයන්න.
v. වෙළඳපොල හිඩැස යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 02 × 05 = 10)

(04) i. මූල්‍ය සැලැස්මක් තුලින් ව්‍යවසායකයාට ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න.
ii. මුළු ආයෝජන ඇස්තමේන්තුව යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
iii. ව්‍යාපාරයක කටයුතු දෛනිකව පවත්වාගෙන යාමට අවශ්‍ය මූලික අරමුදල කාරක ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ. කාරක ප්‍රාග්ධනයට අයත් වියදම වර්ග 04 ක් ලියන්න.
iv. රජය තම සුභසාධන අරමුණු ඉටුකර ගැනීම සඳහා ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර යොදාගනී. ශ්‍රී ලංකාවේ රජය විසින් පවත්වාගෙන යන ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර දෙකක් නම් කරන්න.
v. හිමිකාරත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ග කෙරෙන ආකාරය උදාහරණ සහිතව දක්වන්න.

(ලකුණු 02 × 05 = 10)

(05) i. තේවල ස්වාමී ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේදී අනුගමනය කළයුතු පියවරයන් මොනවා ද?
ii. හවුල් ව්‍යාපාරයක් යනු කුමක්දැයි දක්වා එවැනි ව්‍යාපාරයක මූලික ලක්ෂණ 02 ක් ලියන්න.
iii. වරලත් ව්‍යාපාරයක් තුළින් වරලත් හිමියාට හා වරලත් ලාභියාට මුහුණ දීමට සිදුවිය හැකි ගැටළු 01 බැගින් ලියන්න.
iv. රටක් තුළ ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය වීමෙන් අත්කරගත හැකි ප්‍රයෝජන 02 ක් ලියන්න.
v. ව්‍යවසායකයන් දිරිගැන්වීම සඳහා රජය විසින් ලබාදෙන දිරිගැන්වීම් 04 ක් ලියන්න.

(ලකුණු 02 × 05 = 10)

(06) i. සාර්ථක ව්‍යවසායකයන් බවට පත්වූ ආදර්ශ චරිත ලොව පුරා දකිය හැක. ශ්‍රී ලංකාව තුළ හෝ ලෝකයේ වෙනත් රටක සිටින එවැනි ජනප්‍රිය ආදර්ශ චරිත 02 ක නම් ලියන්න.
ii. ව්‍යවසායකත්වයට එරෙහිව ක්‍රියාත්මක වන සමාජීය සාධක 04 ක් ලියන්න.
iii. ව්‍යාපාරයක සමාජ වගකීම් මට්ටම් හතර දක්වන්න.
iv. සමාජ වගකීම් පිළිපැදීමෙන් ව්‍යාපාරයකට ලැබෙන ප්‍රතිලාභ 02 ක් ලියන්න.
v. කාර්මික තාක්ෂණ ආයතනය ව්‍යවසායකයන්ට ලබාදෙන සේවාවන් 02 ක් ලියන්න.

(ලකුණු 02 × 05 = 10)

(07) පහත දක්වෙන්නේ සුභසිංහ මහතා විසින් ආරම්භ කිරීමට අදහස් කරන බේකරි නිෂ්පාදිත අලෙවි කිරීමේ ව්‍යාපාරය හා සම්බන්ධ තොරතුරු කිහිපයකි.

| අයිතමය | වියදම රු. |
|---|---|
| වීදුරු කුටි 04 ක් මිලට ගැනීම | 100 000 |
| මේස පුටු මිලට ගැනීම | 100 000 |
| විදුලි පහසුකම් ලබාගැනීම | 25 000 |
| පීරිසි කෝප්ප, බන්දේසි හැඳි ඇතුළු වෙනත් උපකරණ මිලට ගැනීම | 65 000 |
| වෙළඳපොළ සමීක්ෂණ වියදම් | 5 000 |
| ජල පහසුකම් ස්ථාපිත කර ගැනීම | 15 000 |
| ව්‍යාපාර සැලසුම් සකස් කිරීම | 20 000 |

- වීදුරු කුටි හා මේස පුටු මිලට ගැනීමට රු. 200 000 ක ණය මුදලක් ලබා ගැනීමට නියමිතය.
- ව්‍යාපාර ස්ථානය සඳහා සුභසිංහ මහතා සතු රු. 1 000 000 වටිනා ගොඩනැගිල්ල යොදා ගැනීමට අදහස් කරයි.
- එදිනෙදා ව්‍යාපාර කටයුතු වෙනුවෙන් අත තිබිය යුතු මුදල රු. 150 000 කි.
- ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමේ උත්සවය සඳහා රු. 10 000 මුදලක් වැයවේයයි අපේක්ෂා කෙරේ.

i. සුභසිංහ මහතාගේ ව්‍යාපාරය සඳහ සුදුසු ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද? (ල. 02)

ii. බැංකු ණය ලබාගැනීමට අමතරව ඔහුට ප්‍රාග්ධනය සපයාගත හැකි මාර්ග 02 ක් ලියන්න. (ල. 02)

iii. සුභසිංහ මහතාගේ ව්‍යාපාරයේ මුළු ආයෝජන ඇස්තමේන්තුව සකස් කරන්න. (ල. 06)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(1) | 3 -(2) | 4 -(3) | 5 -(4) | 6 -(4) | 7 -(1) | 8 -(1) | 9 -(2) | 10 -(4) |
| 11-(3) | 12 -(1) | 13 -(1) | 14 -(4) | 15 -(3) | 16 -(4) | 17 -(1) | 18 -(4) | 19 -(1) | 20 -(1) |
| 21-(2) | 22 -(3) | 23 -(3) | 24 -(2) | 25 -(4) | 26 -(3) | 27 -(2) | 28 -(1) | 29 -(4) | 30 -(2) |
| 31-(2) | 32 -(1) | 33 -(3) | 34 -(4) | 35 -(3) | 36 -(3) | 37 -(2) | 38 -(1) | 39 -(3) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. • ස්වයං පෙළඹීම • දැඩි ආශාව • නවෝත්පාදනය

ii. සිසිල නිෂ්පාදිත / සිසිල ආවරණ

iii. නිර්මාණශීලී චින්තනය තුළින්

iv. ප්‍රජා පරිසරය

v. ද්විතීක අංශයට

vi. • ව්‍යාපාර අවස්ථා සැපයීම • දේශීය සම්පත් භාවිතයට ගැනීම • නවෝත්පාදන බිහි කිරීම

vii. සිසිල නිෂ්පාදිත නිෂ්පාදනය කිරීමට තීරණය කිරීම.

viii.

| | |
|---|---|
| කොහු බත් සඳහා | 2000 |
| මැටි සඳහා | 1000 |
| වැලි සඳහා | 3000 |
| රබර් කිරි සඳහා | 1500 |
| පුහුණු සේවක වැටුප් | 30 000 |
| නුපුහුණු සේවක වැටුප් | 10 000 |
| ඒකක 1000 සඳහා මුළු නිෂ්පාදන පිරිවැය | 47 500 |

ix. ඒකකයක් නිපදවීමට යන වියදම = $\frac{\text{මුළු නිෂ්පාදන පිරිවැය}}{\text{නිපදවූ ඒකක ගණන}}$ (ල.01)

$= \frac{475\ 000}{1000}$

= රු. 47.50/= (ල.01)

(02) i. • විවිධත්වය ග්‍රහණය කර ගැනීම • අසාර්ථකත්වය ඉවසීම • කුතුහලය දිරිමත් කිරීම • ගැටලු අභියෝග ලෙස දැකීම • නිර්මාණශීලී පුහුණු අවස්ථාවට සහභාගි වීම • නිර්මාණශීලීත්වය අගය කිරීම

ii. • අනපේක්ෂිත සිදුවීම් • ක්‍රියාවලි අවශ්‍යතා • වෙළඳපලේ වෙනස්වීම් • ප්‍රජා පරිසරයේ හා ජන ජීවිතයේ මග වෙනස්කම් • සංජානනය හෙවත් තේරුම් ගන්නා ආකාරය වෙනස්වීම • දැනුම පදනම් කරගත් සංකල්ප (කරුණු 04 කට ලකුණු 02)

iii. • ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභ • දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ (කරුණු 02 කට ලකුණු 01)

iv. • සීමිත සම්පත් ප්‍රමාණයකින් වුවද ආරම්භ කළ හැකි වීම. • පවත්වා දේශීය තාක්ෂණය වුවද භාවිතයට ගත හැකිවීම. • ගතික පරිසරයට ක්ෂණිකව ප්‍රතිචාර දැක්විය හැකිවීම. • සේවකයින් බඳවා ගැනීම හා පුහුණුව පහසු වීම. - ගැලපෙන වෙනත් පිළිතුරුකට ලකුණු පිරිනමන්න. (කරුණු 04 කට ලකුණු 02 යි)

v. පෞද්ගලික හිමිකාරත්වය යටතේ ස්වාධීනව මෙහෙයවනු ලබන සාපේක්ෂ ව කුඩා සේවක සංඛ්‍යාවක් හා අඩු ආයෝජනයක් සහිත ව්‍යාපාර කුඩා පරිමාණ ව්‍යාපාර නම් වේ. (නිවැරදි පැහැදිලි කිරීමකට ලකුණු 02 යි)

(ලකුණු 02 × 05 = 10)

(03) i. • තාක්ෂණික කුසලතා • මානව කුසලතා • සංකල්පනාත්මක කුසලතා • සන්නිවේදන කුසලතා • උපදේශන කුසලතා • කණ්ඩායම් සමග කටයුතු කිරීමේ කුසලතා • ආදර්ශවත්ව කටයුතු කිරීමේ කුසලතා (කරුණු 04 කට ලකුණු 02 යි.)

ii. ● ව්‍යාපාරය තුළ පවතින ශක්තීන් හා දුර්වලතා හඳුනාගත හැකිවීම. ● ව්‍යාපාර අවස්ථා හඳුනාගත හැකිවීම. ● ව්‍යාපාර මුහුණ දෙන තර්ජන හඳුනාගත හැකිවීම. ● පරිසර වෙනස්වීම්වලට ගැළපෙන පරිදි නිෂ්පාදන සහ අලෙවි කටයුතු කිරීම. ● පරිසර වෙනස්වීම්වලට ගැලපෙන පරිදි සැලසුම් සකස් කිරීම සහ උපාය මාර්ග තීරණය කිරීම. (කරුණු 04 කට ලකුණු 02 යි)

iii. ● නව නිපැයුමක් ● නව ක්‍රියාවලියක් ● නව යන්ත්‍රයක් ● ඉහත කරුණුවල සංකලනයක් ● පවත්නා සොයා ගැනීමක වැඩිදියුණු කිරීමක් (කරුණු 02 කට ලකුණු 02 යි)

iv. ● පුරා වස්තු ● ගල් කැටයම් ● ලී කැටයම් ● කලා ශිල්ප ගැලපෙන පිළිතුරු සඳහා ලකුණු පිරිනමන්න. (කරුණු 04 කට ලකුණු 02 යි)

v. වෙළඳපලක තෘප්තිමත් නොවූ පාරිභෝගික කොටසක් සිටීනම් එම ....... වෙළඳපල හිඩසයි. (ගැලපෙන අදහසක් සහිත පිළිතුරකට ලකුණු 02)

(ලකුණු 02 × 05 = 10)

(04) i. ව්‍යාපාරයට අවශ්‍ය අරමුදල් ප්‍රමාණය නිගමනය කිරීමට, මූල්‍ය ගැටළු අවම කිරීමට, ලාභය දැන ගැනීමට, ප්‍රතිඵලය ප්‍රමාණවත්ද යන්න දැන ගැනීමට (ල.02)

ii. ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන පුද්ගලයෙකුට එම ව්‍යාපාරය ආරම්භ කිරීමට කොපමණ මුදලක් ආයෝජනය කළයුතුද යන්න දැන ගැනීමට සකස් කර ඇස්තමේන්තුවයි. (ල.02)

iii. අමුද්‍රව්‍ය, සේවක වැටුප්, ජලය, විදුලිය, දුරකථන, ප්‍රචාරක, බදු කුලී, පොලී වෙනත් ගැලපෙන වියදම් වර්ග 04 සඳහා (ල.02)

iv. සුදුසු නිවැරදි පිළිතුරු 02 කට ලකුණු 02 යි.

v. ව්‍යාපාර සංවිධාන

පෞද්ගලික — උදා.:- කේවල ස්වාමී, හවුල්, සමාගම්

රාජ්‍ය — උදා.:- දෙපාර්තමේන්තු, සංස්ථා, රාජ්‍ය සමාගම්

(05) i. ● ප්‍රාදේශීය ලේකම් කර්යාලයෙන් ඉල්ලුම් පත්‍ර ලබාගැනීම, තනිපුද්ගල ව්‍යාපාර නාමයක් ලියාපදිංචිය සඳහා වූ ඉල්ලුම්පත්‍රය, ව්‍යාපාර නාම ලියාපදිංචිය සඳහා වූ ග්‍රාමනිලධාරී වාර්තාවට අදාල ඉල්ලුම් පත්‍රය ● සම්පූර්ණ කල ආකෘති පත්‍ර අදාල ගාස්තු සමඟ ප්‍රාදේශීය ලේකම් වෙත භාරදීම.

ii. ලාභ ලැබීමේ අරමුණින් පුද්ගලයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි පිරිසකගේ සම්බන්ධතාව හවුල් ව්‍යාපාරයකි. (පැහැදිලි කිරීමට ල.1, ඕනෑම ලක්ෂණ 02 ක් දැක්වීමට ල.01 යි.)

iii. ● වරලත් හිමියාට - කීර්ති නාමයට, හානි විය හැකිවීම, නෛතික බැඳීම් වැඩිවීම. ● වරලත්ලාභියා - පිරිවැය දූරීමට සිදුවීම, ස්වාධීනත්වය අහිමි වීම, පුරස්කාර ගෙවීම (ල.01)

iv. රැකියා සැපයීම, ආර්ථික වර්ධනය, සම්පත් භාවිතය, ආදායම් බෙදීයාමේ විෂමතාව අඩුවීම. (ල.02)

v. බදු සහන, ණය, ආධාර, පුහුණුව, වෙළඳපොල ලබාදීම, ප්‍රදර්ශන සංවිධානය (ල.02)

(ලකුණු 02 × 05 = 10)

(06) i. නිවැරදි පිළිතුරට ලකුණු 02 යි.

ii. රැකියා සඳහා ඉහල පිළිගැනීම, අභියෝග භාර ගැනීමට අකමැති වීම, අධ්‍යාපනය තුලින් දිරිමත් නොවීම, රාජ්‍ය දිරි ගැන්වීම් ප්‍රමාණවත් නොවීම, යැපුම් මානසිකත්වය (ල.02)

iii. ආර්ථික වගකීම, නීතිමය වගකීම, සදාචාරාත්මක වගකීම, පරාර්ථකාමී වගකීම (ල.02)

iv. කීර්තිනාමය වර්ධනය වීම, පැවැත්ම ස්ථිර වීම, නීතිමය ප්‍රශ්න අවම වීම, ලාභය සහතික වීම, සේවක චිත්ත ධෛර්ය ඉහල යාම. (ල.02)

v. කර්මාන්ත සඳහා තාක්ෂණ උපදෙස්, විද්‍යාගාර හා තාක්ෂණික උපකරණ ක්‍රමාංකනය, නිෂ්පාදන හා නිෂ්පාදන ක්‍රියාවලිය සංවර්ධනය, කර්මාන්ත හා විද්‍යාගාර මිනුම්, විද්‍යුත් උපකරණ අලුත්වැඩියාව, අමුද්‍රව්‍ය නිම්භාණ්ඩ පරීක්ෂාව හා තත්ත්ව පාලනය, තාක්ෂණික පුහුණුව (ල.02)

(07) i. කේවල ස්වාමී ව්‍යාපාරය (ල. 02)

ii. තමාගේ ඉතිරි කිරීම්, වත්කම් විකිණීම, පවුලේ අයගෙන් ලබාගැනීම (ල. 02)

iii.

සුහසිංහ මහතාගේ ව්‍යාපාරය
මුළු ආයෝජන ඇස්තමේන්තුව (½)

| | යෝජිත ආයෝජනය | | මුළු ආයෝජනය | |
|---|---|---|---|---|
| | අයිතිකරු යොදවන රු. | බැංකු ණය රු. | | |
| ස්ථාවර වත්කම් | | | | |
| ගොඩනැගිල්ල | 1 000 000 | | 1 000 000 | (½) |
| වීදුරු කුටි | | 100 000 | 100 000 | (½) |
| මේස පුටු | | 100 000 | 100 000 | (½) |
| වෙනත් උපකරණ | 65 000 | | 65000 | (½) |
| A මුළු ස්ථාවර වත්කම් | 1065 000 | 200 000 | 1 265 000 | |
| ආරම්භ කිරීමට පෙර වියදම් | | | | |
| විදුලි පහසුකම ලබාගැනීම | 25 000 | | 25 000 | (½) |
| වෙළඳපොළ සමීක්ෂණ වියදම | 5 000 | | 5 000 | (½) |
| ජල පහසුකම ස්ථාපිත කිරීම | 15 000 | | 15 000 | (½) |
| ව්‍යාපාර සැලසුම් සකස් කිරීම | 20 000 | | 20 000 | (½) |
| සමාරම්භක උත්සවය | 10 000 | | 10 000 | (½) |
| B ආරම්භ කිරීමට පෙර වියදම් | 75 000 | | 75 000 | |
| කාරක ප්‍රාග්ධනය | | | | |
| දෛනික ව්‍යාපාර කටයුතු සඳහා | 150 000 | | 150 000 | |
| C මුළු කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව | 150 000 | | 150 000 | (½) |
| මුළු ආයෝජනය A + B + C | 1290 000 | 200 000 | 1490 000 | (½) |

(ල. 06)